පේරාදෙණිය විශ්වවිද්‍යාලය
UNIVERSITY OF PERADENIYA

දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය
CENTRE FOR DISTANCE AND CONTINUING EDUCATION

ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධි පරීක්ෂණය (පැරණි නිර්දේශය) - (නොවැම්බර්/දෙසැම්බර් 2019)
GENERAL DEGREE EXAMINATION IN ARTS (Old Syllabus) – (November /December 2018)

**SINHALA I ( SLG 1 )**
**( ප්‍රබන්ධ කථා හා නාට්‍ය කලාව )**

**කාලය පැය තුනයි (03).**

සෑම කොටසකින් ම **එක්** ප්‍රශ්නයක්වත් ඇතුළත් වන සේ ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.
නොපැහැදිලි අත්අකුරුවලට ලකුණු කපනු ලැබේ.
මෙහි අඩංගු ප්‍රශ්න සංඛ්‍යාව (09) නවයකි.

---

## I කොටස

1. **විරාගය** ලියැවුණු යුගයෙහි පැතිරගිය පුද්ගල පුරුෂාර්ථවල ස්වභාවය විස්තර කරන්න.

2. **විරාගය** නවකථාව ස්ථාන ගතවන සාංදෘෂ්ටිකවාදය (Existentialism) නම් වූ සාහිත්‍ය ප්‍රවණතාව පිළිබඳ සටහනක් ලියන්න.

3. "**එමා බොවාරි** නවකථාවේ එන "එමා" නම් වූ තරුණ කාන්තාවගේ ඛේදවාචකයට, ඇ ජීවත් වූ සමාජයේ අසංවේදී හා ජඩ ප්‍රජාව වග කිව යුතුය." යන ප්‍රකාශය විවරණය කරන්න.

## I I කොටස

4. "ගුණදාස අමරසේකරගේ "ජීවන සුවඳ" තුළින් හැඟුම්බර මනෝභාව ඇති උගත් තරුණයන්ගේ එක් ටැම් පෞද්ගලිකත්වයෙහි (ivory individualism) කඩා වැටීම අඟවයි." පක්ෂව හෝ විපක්ෂව කරුණු දක්වන්න.

5. ගුණදාස අමරසේකරගේ **"ජීවන සුවඳ"** සංග්‍රහයේ එන බොහෝ කෙටිකතා සඳහා ඩී. එච්. ලෝරන්ස්ගේ රචනාවල එන සංකල්ප බලපා ඇති ආකාරය විමසන්න.

6. "කවබත යශුනරිගේ කෙටිකතා විග්‍රහ කළ හැක්කේ රෝමාන්තිකවාදයත්, යථාර්ථවාදයත් අතර පිහිටා සිටිමිනි." යන ප්‍රකාශය සමාලෝචනය කරන්න.

(අනෙක් පිට බලන්න)

## **I I I කොටස**

7. "හෙන්රික් ඉබ්සන්ගේ සෙල්ලම්ගෙය නාට්‍යයේ එන නෝරාගේ ශිථිල පැවැත්ම පසුබිමෙහි ඉතා දැඩි චරිතාදර්ශයක් සැඟව පැවතිණ." විස්තර කරන්න.

8. **මැටි කරත්තය** නාට්‍යයෙහි නිර්මාණය වන සංසිද්ධීන් විග්‍රහ කිරීම පිණිස උපයෝගී කරගත හැකි හොඳම නිර්ණායකය විය හැක්කේ බෞද්ධ හේතු ඵල න්‍යායයි යන්න සනිදර්ශනව විභාග කරන්න.

9. "මහාචාර්ය සරච්චන්ද්‍රගේ "**පෙමතො ජායතී සොකො**" නාට්‍යයට ප්‍රස්තුත වූ පුවතෙහි එන පසුබිම් චරිතවල ක්‍රියාකාරිත්වය පටු දෘෂ්ටි ඇති ආත්මාර්ථකාමී පුද්ගලයන්ගේ නොමිනිස්කම් අනුරූපණය කරයි." යන්න මානවවාදී දෘෂ්ටියකින් විශ්ලේෂණය කරන්න.

(සෑම ප්‍රශ්නයකටම ලකුණු 20 බැගිනි.)